# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2006/9 – 2017 පෙබරවාරි 13 වැනි සඳුදා – 2017.02.13**

**(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/O/2014/132.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්,

ආර්.ආර්.කිත්සිරි මයා, අංක. 30/6, පොල්හේන පාර, යක්කල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක. 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, වේයන්ගොඩ, පත්තලගෙදර, මොරටුවත්ත, අංක. 114/1, P. දනන්සූරිය මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.


1A – G 25124 – 07 (2017/02)
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මගේ අංකය: IR/COM/02/O/2014/132.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ආර්. ආර්. කිත්සිරි මයා, අංක. 30/6, පොල්හේන පාර, යක්කල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක. 15, රොක් හවුස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ආර්. ආර්. කිත්සිරි මහතාට යාත්‍රාපති තනතුර සඳහා ගෙවනු ලබන විශේෂ දීමනාව වන රුපියල් දසදහසක (රු.10000/-) දීමනාව හා රුපියල් දහසක (රු.1000/-) දුරකථන දීමනාව නොගෙවීම සාධාරණ හා යුක්ති සහගත වන්නේද? එසේ නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

03 - 09

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.